BRIDGE to EQUALITY
සමානාත්මතාවය සොයා...
சமத்துவத்தை தேடுதல்...

# LGBTQ ප්‍රජාව මුහුණ දෙන මානව හිමිකම් උල්ලංඝණය කිරීම්

(අගෝස්තු 2021- මාර්තු 2023)

BRIDGE to Equality
විසින් ලේඛණගත කරන ලදි.

# LGBTQ ප්‍රජාව මුහුණ දෙන
# මානව හිමිකම් උල්ලංඝණය කිරීම්

(අගෝස්තු 2021- මාර්තු 2023)

BRIDGE to Equality
විසින් ලේඛණගත කරන ලද්දකි.

**ශ්‍රී ලංකාවේ LGBTQ ප්‍රජාව මුහුණ දෙන**
**මානව හිමිකම් උල්ලංඝණය කිරීම්**

(අගෝස්තු 2021- මාර්තු 2023)

**BRIDGE විසින් කරන ලද විශ්ලේෂණය**

BRIDGE to Equality විසින් ප්‍රකාශයට පත්කර ඇත.

bridgetoequality@gmail.com

# පටුන


පළමු කොටස(පාරිභාෂික පද මාළාව) ........ 01

දෙවන කොටස: හැඳින්වීම ........ 03

තෙවන කොටස: ක්‍රමවේදය ........ 04

සිවුවන කොටස: පැහැදිලි කිරීම් ........ 05

පස්වන කොටස: නඩු විශ්ලේෂණය (මානව හිමිකම් උල්ලංඝණය වීම්) ........ 06

5.1 වින්දිතයන්ගේ පොදු ලක්ෂණයන්ට එරෙහිව මානව හිමිකම් උල්ලංඝණය කිරීම් විශ්ලේෂණය කිරීම ........ 08

5.2 මානව හිමිකම් උල්ලංඝණය වීම් වල ප්‍රවණතාවය ........ 11

5.3 පෞද්ගලික අත්දැකීම් ........ 16

හයවන කොටස: මූලික සොයාගැනීම් ........ 18

හත්වන කොටස: නිගමනය ........ 20

අටවන කොටස: නිර්දේශ ........ 21

සාමාන්‍ය නිර්දේශ ........ 21

විශේෂ නිර්දේශ ........ 22

## පළමු කොටස:
# පාරිභාෂික පද මාලාව

**LGBTQ:** LGBTQ යනු සමරිසි පිරිමි, සමරිසි ගැහැණු, ද්විරිසි, සංක්‍රාන්තික සමාජභාවී, සහ කුවියර හෝ තමාගේ අනන්‍යතාවය පිළිබඳව ගැටලුකාරී තත්වයක පසුවන (questioning) පුද්ගලයන් සඳහා වූ කෙටි යෙදුමකි.

**සමරිසි ගැහැණු :** ශාරීරිකව, මානසිකව සහ අධ්‍යාත්මිකව වෙනත් කාන්තාවන් වෙත ආකර්ෂණය වන කාන්තාවක්.

**සමරිසි පිරිමි :** පුරුෂයෙකු තවත් පුරුෂයෙක් වෙත ශාරීරිකවල මානසිකව සහ අධ්‍යාත්මිකව ආකර්ෂණය වීම සමරිසි පිරිමි වේ. මෙය සාමාන්‍යයෙන් පුරුෂයෙකුට ආදරය කරන තවත් පුරුෂයෙක් විස්තර කිරීමට භාවිතා කරන අතර 'සමරිසි ප්‍රජාව' ලෙසින් මුළු LGBTQ ප්‍රජාවම හැඳින්වීම සඳහා නිරතුරුව භාවිතා වේ.

**ද්විරිසි :** පිරිමි සහ ගැහැණු යන දෙපාර්ශවය වෙතම ශාරීරිකව, මානසිකව, සහ අධ්‍යාත්මිකව ආකර්ෂණය වන පුද්ගලයෙකි.

**සංක්‍රාන්තික සමාජභාවී පුද්ගල :** තමාට උපතින් හිමි වී ඇති ලිංගය සමඟ තමාගේ පුද්ගල අනන්‍යතාවය සහ සමාජභාවය පිළිබඳ හැඟීම අනුරූප නොවන පුද්ගලයෙකි.

**තමාගේ අනන්‍යතාවය පිළිබඳව ගැටලුකාරී තත්ත්වයක පසුවන :** (questioning): තමාගේ ලිංගිකත්වය හෝ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ ගැටලුකාරී තත්වයක පසුවන (questioning) පුද්ගලයෙක්.

**කුවියර :** විෂමරිසි (Straight) සහ සිස් සමාජභාවී (Cisgender) හැර වෙනත් ලිංගික සහ සමාජභාවී අනන්‍යතාවන් විස්තර කරන වචනයකි. සමරිසි ස්ත්‍රීන්, සමරිසි පිරිමින්, ද්විරිසි පුද්ගලයන්, සහ සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයන් සියලු දෙනාම කුවියර යන පදයෙන් හඳුනා ගත හැකිය.

**සිස් සමාජභාවී :** (Cis-gender) පුද්ගල අනන්‍යතාවය සහ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ හැඟීම ඔවුන්ගේ උපන් ලිංගයට අනුරූප වන පුද්ගලයෙකු හැඳින්වීමට

**වින්දිතයන් :** මානව හිමිකම් උල්ලංඝණය වීමකට හෝ සාමාන්‍ය අපරාධයකට මුහුණ දුන් LGBTQ පුද්ගලයන් මෙලෙස හැඳින්වේ.

**අපරාධකරුවන් (චූදිතයන්) :** මානව හිමිකම් උල්ලංඝණය වීම් සහ පොදු අපරාධවලට ලක්ව වින්දිතයන් එම තත්ත්වයට පත් කළ පුද්ගලයන්.

**ප්‍රලේඛන නිලධාරීන්** (DOs)**:** වින්දිතයන් සෙවීමේ කාර්යය භාරව සිටින මොවුන් YOH සහ NTN සමඟ බිම් මට්ටමේ සේවය කරන ක්ෂේත්‍ර නිලධාරීන් වේ. මොවුන් බොහෝ විට ප්‍රජාව තුළ සම්බන්ධතා සහ සැලකිය යුතු සමාජ මාධ්‍ය බලපෑමක් ඇති ප්‍රජාවේ සාමාජිකයන්ය.

**මූලික අයිතිවාසිකම්:** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රකාශ කළ පිළිගන්නා ලද මානව හිමිකම් මූලික අයිතිවාසිකම් යනුවෙන් හඳුන්වයි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 වන ව්‍යවස්ථාවේ (ඈ) අනුව්‍යවස්ථාවට අනුව, ඒවා "සියලු පාලන ආයතන විසින් ගරු කරනු ලැබිය යුත්තේ ය; ආරක්ෂා කරනු ලැබිය යුත්තේ ය; වර්ධනය කරනු ලැබිය යුත්තේ ය. තව ද, ඒ මූලික අයිතිවාසිකම් මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට සහ ප්‍රමාණයට මිස සංක්ෂිප්ත කිරීම, සීමා කිරීම හෝ අහිමි කිරීම නොකළ යුත්තේ ය". මෙම අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ දක්වා ඇති අතර 11, 12, 13 සහ 14 යන ව්‍යවස්ථාවන් ඇතුළත් වේ.

**සාමාන්‍ය අපරාධ:** පුද්ගලයන්ට එරෙහිව සිදු කෙරෙන සාපරාධී වැරදි සාමාන්‍ය අපරාධ වේ. සාමාන්‍ය අපරාධවලින් බොහෝමයක් ශ්‍රී ලංකාවේ 1883 අංක 2 දරණ දණ්ඩ නීති සංග්‍රහ ආඥාපනතෙහි නිර්වචනය කර ඇති අතර තවත් අපරාධ සමහරක් 2009 අංක 8 දරණ මෝටර් වාහන පනත, 1842 පාදඩ ආඥා පනත වැනි නීතින්ද මගින් අර්ථ දක්වා ඇත.

**හඳුනාගැනීමේ සාධක:** වයස, සමාජභාවය, ලිංගික දිශානතිය, භූගෝලීය පිහිටීම, ආර්ථික තත්ත්වය යනාදී ලෙස වින්දිතයන්ට පොදුවේ ඇති විවිධ සාධක මේවා වේ.

**පිටතට පැමිණී තත්වය** (Out status) **:** වින්දිතයන් ඔවුන්ගේ ලිංගික දිශානතිය/සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව ප්‍රසිද්ධියේ පවසා ඇත් ද යන්න.

**සුළු ජනවාර්ගික කණ්ඩායම්:** මෙය ශ්‍රී ලංකාවේ සුළුතර ජනවාර්ගික කණ්ඩායම් වෙත යොමු වේ. මෙම දත්ත සංක්ෂිප්තයේ වැඩි වශයෙන් ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර පළාත්වල වෙසෙන දෙමළ සහ මුස්ලිම් ජාතිකයන් පිළිබඳව ඇතුළත් වේ.

# දෙවන කොටස:
# හැඳින්වීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (1978 දී පනවන ලද) 12 වන ව්‍යවස්ථාවේ 2 වන අනු ව්‍යවස්ථාව යටතේ 'ස්ත්‍රී පුරුෂ භාවය' සහ "ඉන් කවර හෝ හේතුවක්" මත පදනම්ව වෙනස් කොට සැලකීමෙන් ශ්‍රී ලංකාවේ පුද්ගලයන් ආරක්ෂා වී ඇත. කෙසේ වෙතත්, "කාමුක සංසර්ගය" සහ සමරිසි පුද්ගලයින් අතර තදබල අශෝභන ක්‍රියාවන් (නීතියේ විස්තර කර ඇති ආකාරයට "ස්වභාව ධර්මයට විරුද්ධව සිදු කරන ක්‍රියා") 1833 ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365අ යන වගන්තීන් යටතේ අපරාධයක් ලෙස සලකනු ලැබේ. මෙමඟින් මෙම ක්‍රියාවන්ට සම්බන්ධ වූවන් සමාජභාවය පිළිබඳ නොසලකා සමරිසි ලිංගික ක්‍රියා ලෙස සලකමින් සාපරාධී කරනු ලැබේ. මෙම දණ්ඩ නීතින් මඟින්, විවිධ සමාජ අපවාදයන් ඇතුලුව LGBTQ ප්‍රජාව දශක ගණනාවක් තිස්සේ අගතීන්, අසාධාරණයන් සහ ප්‍රචණ්ඩත්වයන් රාශියකට ලක් කර ඇත. සමරිසි සබඳතා සාපරාධීකරණය කිරීම පිළිබඳ සටන 1990 අගභාගයේ මතුවී, එතැන් පටන් ශක්තිමත්ව වර්ධනය වුවද මෙම නීතිමය, දේශපාලන සහ සමාජයීය බාධක තවමත් පවතී. මෙම දත්ත විශ්ලේෂණ සංක්ෂිප්තයේ අරමුණු වන්නේ:

- LGBTQ ප්‍රජාව නිරූපණය කරනු ලබන යම් කුලකයට එරෙහිව සිදු කරන ලද වැරදි සහ මානව හිමිකම් උල්ලංඝණය කිරීම පිළිබඳ විශ්ලේෂණය කිරීම.

- ප්‍රජාවේ සාමාජිකයින් මුහුණ දෙන ප්‍රධාන ගැටලු, වඩාත් බහුලව සිදුවන සාමාන්‍ය අපරාධ සහ මානව හිමිකම් උල්ලංඝණය කිරීම්වලට අදාළ පොදු ලක්ෂණ සහ එම අපරාධ සහ උල්ලංඝණයන් සිදු කරනු ලැබූ අපරාධකරුවන් පිළිබඳ ප්‍රමාණාත්මක විශ්ලේෂණයක් සැපයීම.

- LGBTQ ප්‍රජාව මුහුණ දෙන ගෘහස්ථ ගැටලු අවබෝධ කර ගැනීමේදී ක්‍රියාකාරීන්, නීතිඥයින් සහ මානව හිමිකම් ආරක්ෂකයින්ගේ වැඩවලට සහය දීමට සහ ඔවුන්ගේ දැනුම ශක්තිමත් කිරීම.

- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව (HRCSL) සහ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් යාන්ත්‍රණ ද ඇතුළුව ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාවය සහ ප්‍රකාශනය පිළිබඳව එක්සත් ජාතීන්ගේ ස්වාධීන විශේෂඥයින් සමඟ සම්බන්ධ වීම.

- වත්මන් නීතිමය රාමුව මඟින් පනවා ඇති අභියෝග ජය ගැනීමල LGBTQ ප්‍රජාවගේ මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂාව සඳහා පහසුකම් සැලසීම කෙරෙහි අවධානය යොමු කිරීම.

## තෙවන කොටස:
# ක්‍රමවේදය

මෙම දත්ත මඟින් Young Out Here (YOH) සහ National Transgender Network (NTN) යන සංවිධාන දෙකේ සහාය ඇතිව වසර දෙකක් පුරාවට රැස් කරන ලද මානව හිමිකම් උල්ලංඝණය වීමේ සිද්ධීන් 235ක් පිළිබඳව ප්‍රමාණාත්මකව විශ්ලේෂණය කරයි. මෙහි අරමුණ ශ්‍රී ලංකාවේ LGBTQ ප්‍රජාව මුහුණ දෙන ගැටලු විශ්ලේෂණය කිරීම වේ.

ප්‍රලේඛන නිලධාරීන් විසින් සම්මුඛ පරීක්ෂණ ආකාරයෙන් YOH සහ NTN යන සංවිධාන සිද්ධීන් එකතු කරන ලදී (YOH සහ NTN යන සංවිධාන දෙකටම ප්‍රලේඛන නිලධාරීන් 10 බැගින් සිටී). ඔවුන්ගේ පෞද්ගලික සම්බන්ධතා භාවිතා කරමින් ප්‍රලේඛන නිලධාරීන් වින්දිතයන් වෙත ළඟා වී ඇත. ඉන් අනතුරුව ඔවුන් වින්දිතයන් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වා, YOH සහ NTN හි දේශීය නීති උපදේශක විසින් කෙටුම්පත් කරන ලද තොරතුරු රැස් කිරීමේ පත්‍රිකා පුරවා ඔවුන්ට එරෙහිව සිදු වූ මානව හිමිකම් උල්ලංඝණය වීම් සම්බන්ධයෙන් තොරතුරු රැස් කර ඇත. වින්දිතයන් පොලිසියට හෝ මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිල්ල ඉදිරිපත් කිරීමට කැමැත්ත පළ කර ඇති අවස්ථාවලදී, ඔවුන්ගේ ලිඛිත අනුමැතිය ඇතිව අදාළ ආයතන වෙත ඉදිරිපත් කර අනෙකුත් ඒවා ලේඛනගත කිරීම සඳහා සටහන් කර ඇත.

දැනටමත් පවතින ජාල භාවිතා කරමින් උතුරු-නැගෙනහිර ප්‍රදේශවලින් සිද්ධීන් රැස් කිරීමට BRIDGE ව්‍යාපෘතිය මගින් පියවර ගන්නා ලදී. නමුත්, උතුරු නැගෙනහිර පළාත් වල දත්ත එකතු කිරීමට සීමිත මූලාශ්‍ර ප්‍රමාණයක් තිබීම නිසා, එම පළාත්වලට ප්‍රලේඛන නිළධාරීන් දෙදෙනෙකු පමණක් සිටී. 2023-2023 කාලය තුළ, උතුරු නැගෙනහිර පළාත්වලින් දත්ත රැස් කිරීම සඳහා පවතින ජාල සවිමත් කිරීමට BRIDGE කණ්ඩායමට හැකි වී ඇත. එමනිසා, මෙකී සන්දර්භය තුළ සපයන ලද දත්ත තේරුම් ගත යුතුය.

මෙහි ඇතුලත් දත්ත මගින් ශ්‍රී ලංකාව තුළ LGBTQ පුද්ගලයන්ට එරෙහිව බහුලව පවතින උල්ලංඝණයන් හඳුනාගනු ලබයි. එසේම, එසේ හඳුනාගත් සිද්ධීන් භාවිතයෙන්, වයස, සමාජභාවය, ලිංගික දිශානතිය, භූගෝලීය පිහිටීම, ආර්ථික තත්ත්වය, උල්ලංඝණය වර්ගය, අවශ්‍ය වූ පිළියම වැනි පොදු ලක්ෂණ මත පදනම්ව වූදිතයන් ගණනය කර, මූලික සොයාගැනීම් හඳුනා ගැනීම සිදු කරනු ලබයි.

# සිවුවන කොටස:
# පැහැදිලි කිරීම්

## 4.1 මානව හිමිකම් උල්ලංඝණය කිරීම් යනු කුමක්ද?

මානව හිමිකම් යනු උපතේ සිට මරණය දක්වා ලෝකයේ සෑම පුද්ගලයෙකුටම අයත් වන මූලික අයිතිවාසිකම් වේ. මූලික අයිතිවාසිකම් යනු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගන්නා ලද අයිතිවාසිකම් සමූහයකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් රටේ නීතිය යටතේ ආරක්ෂා කර ඇති පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් ප්‍රකාශ කොට පිළිගනී . ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 (ඈ) ව්‍යවස්ථාව රජයේ සියලුම පාලන ආයතන වෙත යොමු කර ඇති අතර පුද්ගලයන්ගේ මූලික අයිතිවාසිකම්වලට ගරු කිරීම සහ සුරක්ෂිත කිරීම මඟින් ඔවුන්ගේ පරමාධිපත්‍යය ආරක්ෂා කිරීම අරමුණු කරයි. මෙම අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදය මඟින් ආරක්ෂා කර ඇති අතර එම පරිච්ඡේදය යටතේම 10, 11, 12, 13, සහ 14 යන ව්‍යවස්ථාවල දක්වා ඇත. මෙම අයිතිවාසිකම් අතර සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස (10 වැනි ව්‍යවස්ථාව), කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට එරෙහිව ආරක්ෂා වීමේ අයිතිය (11 වැනි ව්‍යවස්ථාව), නීතිය යටතේ සමාන ආරක්ෂාවක් තිබීම සහ වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත පදනම්ව වෙනස්කමකට භාජනය නොවීමට ඇති අයිතිය (12 වන ව්‍යසවථාවේ 1 වන සහ 2 වන අනු ව්‍යවස්ථා), නීත්‍යානුකූල නොවන අත්අඩංගුවට ගැනීම්වලින් සහ රඳවා තබා ගැනීමෙන් ආරක්ෂා වීම සහ සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය (13 වන ව්‍යවස්ථාවේ (1) (2) (3) වන අනු ව්‍යවස්ථා) සහ වරදකරු යයි ඔප්පු කරනු ලබන තෙක් නිර්දෝෂී යයි පූර්වානුමාන කිරීම (13 වැනි ව්‍යවස්ථාව 5 වන අනු ව්‍යවස්ථාව), භාෂණයේ නිදහස, රැස්වීමේ නිදහස, වෘත්තීය සමිතිවලට බැඳීමේ නිදහස යනාදිය සහ තොරතුරු දැනගැනීමේ අයිතිය (14 වැනි ව්‍යවස්ථාව) යන ව්‍යවස්ථාවන් ඇතුළත් වේ.

---


[1] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 (ඈ) යන ව්‍යවස්ථාව: ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගනු ලබන මූලික අයිතිවාසිකම් සියලු පාලන ආයතන විසින් ගරු කරනු ලැබිය යුත්තේය: ආරක්ෂා කරනු ලැබිය යුත්තේ ය: වර්ධනය කරනු ලැබිය යුත්තේ ය. තව ද, ඒ මූලික අයිතිවාසිකම් මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට සහ ප්‍රමාණයට මිස සංක්ෂිප්ත කිරීම, සීමා කිරීම හෝ අහිමි කිරීම නොකළ යුත්තේය.

## පස්වන කොටස:

# නඩු විශ්ලේෂණය (මානව හිමිකම් උල්ලංඝණය වීම්)

මෙම දත්ත මගින් සිදුවීම් 235ක් ප්‍රමාණාත්මකව විශ්ලේෂණය කරයි. ඉන් සිදුවීම් 149ක් **මානව හිමිකම් කොමිෂන් සභාව HRCSL වෙත ඉදිරිපත් කර ඇති නමුත්**, ඉතිරි සිදුවීම් වල වින්දිතයන් එසේ HRCSL වෙත තම ප්‍රශ්නය ඉදිරිපත් කිරීම සඳහා කැමැත්ත පළ කර නැත.

එසේ හඳුනාගත් මානව හිමිකම් උල්ලංඝණය කිරීම් අතර, 11 වන ව්‍යවස්ථාව[2], 12(1)[3] සහ 12(2)[4] ව්‍යවස්ථාව, 13 වැනි ව්‍යවස්ථාව[5], 14 වැනි ව්‍යවස්ථාව[6] සහ 14අ ව්‍යවස්ථාව[7] වැනි ව්‍යවස්ථාවන් උල්ලංඝණය කිරීම් ඇතුළත් වේ. මේ අතරින් වඩාත්ම බහුල වන උල්ලංඝණය කිරීම වනුයේ, 12 වන ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම වේ (100%). මෙයට හේතුව වනුයේ මෙම උල්ලංඝණය කිරීම් සියල්ලම, 12 වන ව්‍යවස්ථාවද ඇතුලුව, අනෙකුත් ව්‍යස්ථාවන් උල්ලංඝණය කිරීම යි. මීලගට බහුල උල්ලංඝණය කිරීම් වනුයේ, 11 වන ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම (56%), 13 වන ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම (6%), 14 වන ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම (2.17%) සහ 14අ වන ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම (0.50%) වේ.




මෙම විශ්ලේෂණයෙන් පෙන්නුම් කරන ආකාරයට, වඩාත්ම බහුල උල්ලංඝණය කිරීම් වනුයේ, 11 වන ව්‍යවස්ථාව එකතුව 12 වන ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම වේ.

---

[2] **11 වැනි ව්‍යවස්ථාව:** කිසිම තැනැත්තකු වධ හිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේ ය.

[3] **12 වැනි ව්‍යවස්ථාව (1):** නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද, නීතියේ රැකවරණය ද, සර්ව සාධාරණ විය යුත්තේ ය.

[4] **12 වැනි ව්‍යවස්ථාව (2):** කිසිම පුරවැසියෙකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජන නොවිය යුත්තේ ය.

[5] **13 වැනි ව්‍යවස්ථාව (1)** නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිරභාරයට ගැනීම නොකළ යුත්තේ ය. යම් තැනැත්තෙකු සිරභාරයට ගනු ලබන්නේ යම් හේතුවක් මතද ඒ හේතුව ඒ තැනැත්තාට දැන් විය යුත්තේය. **(2)** අත්අඩංගුවෙහි තබා ගනු ලැබූ හෝ රඳවා තබා ගනු ලැබූ හෝ අන්‍ය ආකාරයකින් පෞද්ගලික නිදහස අහිමි කරනු ලැබූ හෝ සෑම තැනැත්තකුම නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටිය අනුව ආසන්නතම නිසි අධිකරණයේ විනිශ්චකාරවරයා ඉදිරියට ගෙන යා යුතු අතර, නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව ඒ විනිශ්චකාරවරයා විසින් කරනු ලැබූ ආඥාව මත සහ ආඥාව ප්‍රකාරව මිස, ඒ තැනැත්තා තවදුරටත් අත්අඩංගුවෙහි තබා ගැනීම හෝ රඳවා තබා ගැනීම හෝ ඒ තැනැත්තාගේ පෞද්ගලික නිදහස අහිමි කිරීම හෝ නොකළ යුත්තේ ය.

[6] **14 වන ව්‍යවස්ථාවට අනුව:** (1) සෑම පුරවැසියකුටම - **(අ)** භාෂණයේ නිදහසට සහ ප්‍රකාශනය ඇතුලු අදහස් පළ කිරීමේ නිදහසට; **(ආ)** සාමකාමීව රැස්වීමේ නිදහසට; **(ඈ)** සමාගමයේ නිදහසට **(ඈ)** වෘත්තිය සමිති පිහිටුවීමේ සහ වෘත්තිය සමිතිවලට බැඳීමේ නිදහසට; **(ඉ)** එකලාව හෝ අන් අය හා සමඟ, ප්‍රසිද්ධියේ හෝ පුද්ගලිකව තම ආගම, ලබ්ධිය හෝ විශ්වාසය ඇදහීමෙන්, පිළිපැදීමෙන්, ප්‍රගුණ කිරීමෙන් සහ ඉගැන්වීමෙන් ප්‍රකාශ කිරීමේ නිදහසට

[7] **14 වන ව්‍යවස්ථාවේ (අ) අනු ව්‍යවස්ථාවට අනුව:** (1) සෑම පුරවැසියකුගේම අයිතියක් ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වූ යම් තොරතුරක් වෙත නීතියෙන් සලසා ඇති පරිදි ප්‍රවේශ වීමේ අයිතිවාසිකම ඇත්තේය.

චූදිතයන් 235 දෙනාගෙන් බහුතරයක් (96) පොලිසිය සහ වෛද්‍ය අංශය වන බවට නිගමනය කරන ලදී.

| චූදිතයන් | සංඛ්‍යාතය | ප්‍රතිශතය % |
|---|---|---|
| පොලිසිය | 96 | 40.85% |
| වෛද්‍ය අංශය | 64 | 27.27% |
| Ğ[illegible] නිලධාරීන් / නගර සභා නිලධාරීන් | 22 | 9.78% |
| ප්‍රාදේශීය ලේකම් | 9 | 4.25% |
| හමුදා | 8 | 3.40% |
| රජයේ පාසල් සේවකයන් | 5 | 2.13% |
| රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 6 | 2.55% |
| දුම්රියපොළ සේවකයන් | 3 | 1.28% |
| වෘත්තීය පුහුණු අධිකාරිය | 2 | 0.85% |
| ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව | 2 | 0.85% |
| ශ්‍රී ලංගම බස් සේවකයන් | 2 | 0.85% |
| නීතිපති දෙපාර්තන්මේන්තුව | 2 | 0.85% |
| ළමා හා කාන්තා කටයුතු කාර්යංශය | 1 | 0.43% |
| සඳහන් කර නැත | 1 | 0.43% |
| හමුදා පොලීසිය | 1 | 0.43% |
| ග්‍රාම නිලධාරී | 1 | 0.43% |
| ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව | 1 | 0.43% |
| කම්කරු දෙපාර්තමේන්තුව | 1 | 0.43% |
| රජයේ බැංකු | 1 | 0.43% |
| පළාත් සභාව | 3 | 1.25% |
| නගර සභාව | 1 | 0.43% |
| නාවික හමුදාව | 1 | 0.43% |

## 5.1 වින්දිතයන්ගේ පොදු ලක්ෂණයන්ට එරෙහිව මානව හිමිකම් උල්ලංඝණය කිරීම් විශ්ලේෂණය කිරීම

| දිස්ත්‍රික්කය | සංඛ්‍යාතය | ප්‍රතිශතය % |
|---|---|---|
| ගම්පහ | 57 | 24.26% |
| ගාල්ල | 35 | 14.89% |
| කොළඹ | 35 | 14.89% |
| යාපනය | 15 | 6.38% |
| පුත්තලම | 14 | 5.95% |
| නුවර | 11 | 4.68% |
| අනුරාධපුර | 10 | 4.26% |
| මඩකලපුව | 8 | 3.40% |
| කෑගල්ල | 7 | 2.98% |
| කුරුණෑගල | 8 | 3.44% |
| අම්පාර | 6 | 2.55% |
| පොළොන්නරුව | 3 | 1.28% |
| නුරඑළිය | 3 | 1.28% |
| රත්නපුර | 3 | 1.27% |
| හම්බන්තොට | 3 | 1.27% |
| මන්නාරම | 2 | 0.85% |
| මාතර | 3 | 1.27% |

උතුරු නැගෙනහිර ප්‍රදේශවල සිටින සීමිත ප්‍රලේඛන නිලධාරීන් සංඛ්‍යාව නිසා, එම පළාත්වලින් සීමිත නඩු සංඛ්‍යාවක් ලැබී ඇත. එම නිසා ඉහත නිරූපණය ජනඝණත්වයේ පිහිටීම පිළිබඳ නිවැරදි නිරූපණයක් නොවිය හැකිය.

| වයස | සංඛ්‍යාතය | ප්‍රතිශතය % |
|---|---|---|
| **21-30** | 128 | 54.47% |
| **31-40** | 65 | 27.66% |
| **41-50** | 23 | 9.79% |
| සඳහන් කර නැත | 9 | 3.83% |
| **50 හෝ ඊට වැඩි** | 5 | 2.13% |
| **16-20** | 5 | 2.13% |

| සමාජභාවී අනන්‍යතාවය | සංඛ්‍යාතය | ප්‍රතිශතය % |
|---|---|---|
| සංක්‍රාන්තික සමාජභාවී ස්ත්‍රී | 87 | 37.02% |
| සංක්‍රාන්තික සමාජභාවී පුරුෂ | 85 | 36.17% |
| ස්ත්‍රී | 32 | 13.62% |
| ද්විමය නොවන | 21 | 8.94% |
| සඳහන් කර නැත | 9 | 3.83% |
| සමාජභාවී අනන්‍යතාවය | 1 | 0.43% |

| ලිංගික දිශානතිය | සංඛ්‍යාතය | ප්‍රතිශතය % |
|---|---|---|
| විෂම රිසි | 60 | 25.53% |
| සඳහන් කර නැත | 52 | 22.13% |
| සමරිසි පිරිමි | 49 | 20.85% |
| සමරිසි ස්ත්‍රී | 36 | 15.32% |
| සමරිසි | 24 | 10.21% |
| ලිංගික දිශානතිය | 7 | 2.98% |
| Pansexual | 3 | 1.28% |
| කුවියර | 2 | 0.85% |
| වෙනත් | 2 | 0.85% |

| අධ්‍යාපනය | සංඛ්‍යාතය | ප්‍රතිශතය % |
|---|---|---|
| උසස් පෙළ | 121 | 51.49% |
| සාමාන්‍ය පෙළ | 60 | 25.53% |
| උපාධි | 21 | 8.94% |
| ප්‍රාථමික අධ්‍යාපනය | 15 | 6.38% |
| සඳහන් කර නැත | 9 | 3.83% |
| අධ්‍යාපනික සුදුසුකමක් නැත | 4 | 1.70% |
| ඩිප්ලෝමා | 3 | 1.28% |
| පශ්චාත් උපාධි | 1 | 0.43% |
| ශාස්ත්‍රපති | 1 | 0.43% |


| ආදායම් තත්ත්වය | සංඛ්‍යාතය | ප්‍රතිශතය % |
|---|---|---|
| 20,000-40,000 | 82 | 34.89% |
| 10,000-20,000 | 54 | 22.98% |
| 40,000 හෝ ඊට වැඩි | 44 | 18.72% |
| ආදායමක් නැත | 33 | 14.04% |
| සඳහන් කර නැත | 16 | 6.81% |
| අක්‍රමවත් | 6 | 2.55% |

| ජනවර්ගය | සංඛ්‍යාතය | ප්‍රතිශතය % |
|---|---|---|
| සිංහල | 170 | 72.34% |
| දෙමළ | 40 | 17.02% |
| මුස්ලිම් | 14 | 5.96% |
| සඳහන් කර නැත | 11 | 4.68% |

| ආගම | සංඛ්‍යාතය | ප්‍රතිශතය % |
|---|---|---|
| බුද්ධාගම | 154 | 65.53% |
| හින්දු | 36 | 15.32% |
| ඉස්ලාම් | 15 | 6.38% |
| සඳහන් කර නැත | 11 | 4.68% |
| කතෝලික | 10 | 4.26% |
| ක්‍රිස්තියානි | 6 | 2.55% |
| නිරාගමික | 3 | 1.28% |

## 5.2 මානව හිමිකම් උල්ලංඝණය වීම්වල ප්‍රවණතාවය


**වින්දිතයන්ගේ වාර්ගිකත්වය සහ මානව හිමිකම් උල්ලංඝණය කිරීම් අතර සහසම්බන්ධය**




මෙම ස්ථම්භ ප්‍රස්ථාර නිරූපණයෙන් පෙන්නුම් කරන ආකාරයට 11 වන ව්‍යවස්ථාව සහ 12 වන ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම් වඩාත් බහුල වූ උල්ලංඝණයන් වන අතර, එයට යටත් වන වින්දිතයන් බහුතරයක් සිංහල වාර්ගික කණ්ඩායමට අයත් වේ.


උතුරු හා නැගෙනහිර පළාත්වලින් දත්ත නොමැති වුවද දෙමළ ජනයාට එරෙහිව 12 ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම් සැලකිය යුතු මට්ටමක පවතී.

## වින්දිතයන්ගේ වාර්ගිකත්වය සහ මානව හිමිකම් උල්ලංඝණය කිරීම් අතර සහසම්බන්ධය





මෙම ස්ථම්භ ප්‍රස්ථාර නිරූපණයෙන් පෙන්නුම් කරන ආකාරයට වඩාත්ම ප්‍රචලිත උල්ලංඝණය 11 වන ව්‍යවස්ථාව සහ 12 වන ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම වන අතරල මේ සම්බන්ධයෙන් වඩාත්ම අවදානමට ලක්විය හැකි කණ්ඩායම විෂම රිසි පුද්ගලයන් වන බවයි. නමුත් මෙහි සඳහන් වන සියලුම විෂම රිසි පුද්ගලයන් සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයන් වන බව සලකන්න.

## වින්දිතයන්ගේ වාර්ගිකත්වය සහ මානව හිමිකම් උල්ලංඝණය කිරීම් අතර සහසම්බන්ධය





මෙම ස්ථම්භ ප්‍රස්ථාර නිරූපණය මගින් පෙන්නුම් කරන්නේ අවම ආදායම් මාර්ගයක් සහිත වින්දිතයන් වඩා වැඩියෙන් මානව හිමිකම් උල්ලංඝණය වීම් වලට ගොදුරු වන බවත්, වඩාත්ම ප්‍රචලිත උල්ලංඝණය වන්නේ, 11 වන ව්‍යවස්ථාව සහ 12 වන ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම බවයි.

## වින්දිතයන්ගේ වාර්ගිකත්වය සහ මානව හිමිකම් උල්ලංඝණය කිරීම් අතර සහසම්බන්ධය




මෙම ස්ථම්භ ප්‍රස්ථාර නිරූපණය මඟින් පෙන්නුම් කරන්නේ වඩාත්ම අවදානමට ලක්විය හැකි සමාජභාවී කණ්ඩායම් පිරිමි (සමරිසි හෝ ද්විරිසි ලෙස හඳුනාගත්) සහ සංක්‍රාන්තික සමාජභාවී කාන්තාවන් වන බවත්, වඩාත්ම ප්‍රචලිත මානව හිමිකම් උල්ලංඝණය වන්නේ, 11 වන ව්‍යවස්ථාව සහ 12 වන ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම් වන බවයි.

## වින්දිතයන්ගේ අධ්‍යාපන තත්ත්වය සහ මානව හිමිකම් උල්ලංඝණය කිරීම් අතර සහසම්බන්ධය




මෙම ස්ථම්භ ප්‍රස්ථාර නිරූපණයෙන් පෙන්නුම් කරන ආකාරයට වඩාත් බහුල උල්ලංඝණය 11 වන ව්‍යවස්ථාව සහ 12 වන ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම වන අතර වඩාත්ම අවදානමට ලක්විය හැකි කණ්ඩායම සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය හදාරා ඇති අය වේ.

## 5.3 පෞද්ගලික අත්දැකීම්

**වින්දිතයන්ගෙන් ඇතැම් පිරිසක් ලබාදුන් සාක්ෂි පහත පරිදි වේ;**

**M.P. ඇයගේ ලිංගික දිශානතිය හේතුවෙන් ලිංගාශ්‍රිත රෝග සායනයේදී වෙනස් කොට සැලකීමට ලක් වූ අතර එහිදී ඇය සමච්චලයට හා අපහාසයට ලක් විය.**

*"වෛද්‍යවරයා මට බැණ වැදුණේ, ඔබට නිතරම පරීක්ෂා කිරීමට අවශ්‍ය වන්නේ ඇයි" "ඔබට එතරම් ලිංගික සම්බන්ධකම් තිබෙනවාද" "හැමදාම ලිංගිකව හැසිරීමට තරම් ඔබට මොකක්ද වෙලා තියෙන්නේ?" "ඔබ වෙනත් පිරිමින් සමඟ ලිංගිකව හැසිරෙන්නේ ඇයි?" "ඔබට ලිංගික අවශ්‍යතා මෙතරම් උවමනා නම් විවාහ නොවන්නේ ඇයි?" ලෙස පවසමිනි.*

**G.T. ව නීති විරෝධී ලෙස අත්අඩංගුවට ගෙන, වෙනස් කොට සැලකීමට සහ සමච්චලයට ලක් කර ඇත.**

*"මගේ පසුම්බිය සෝදිසි කිරීමේදී එහි තිබී කොන්ඩම් දෙකක් හමු වූ අතර, එම නිසා ඔවුන් සමඟ පොලිසියට පැමිණිය යුතු බව ඔවුන් ප්‍රකාශ කළා. අපේ ඔළුවටත් කීප වතාවක්ම ගැහුවා. කොන්ඩම් ළඟ තබා ගැනීම නීති විරෝධී දැයි එම නිලධාරියාගෙන් විමසූ විට ඔහු පැවසුවේ, එය අපිට අදාළ දෙයක් නොවන බවත් ඔවුන්ගෙන් අනවශ්‍ය ප්‍රශ්න නොවිමසා ඔවුන් පවසන ආකාරයට කටයුතු කරන බවත් ය.*

*නිළධාරීන් දෙන්නා ඉන් පස්සෙ අපිව ළඟ තියෙන කැළෑ රොදක් වැනි තැනකට රැගෙන ගිහින්, ඔවුන්ගේ ලිංගික උවමනාවන් ඉෂ්ඨ කරන්නයැයි අපට කිව්වා. ඔවුන් අපට බල කලා මුඛ සංසර්ගයේ යෙදෙන ලෙස. ඔවුන් ඒ සම්පූර්ණ කාලය පුරාම හිටියේ නිළ ඇඳුමෙන්. ඔවුන් ඒ ක්‍රියාවන් අතරතුර සිගරට් පවා පාවිච්චි කලා. ඊළඟට සිදු වන්නේ කුමක්ද කියලා නොදැන සිටීම සහ අප තුල, තිබූ බය නිසා අපි ඔවුන් අපට කියූ දේ ඒ අයුරින් ඉෂ්ට කලා"*

**V.S. පොලීසිය තුලදී වද හිංසනයට, සරදමට සහ වෙනස් කොට සැලකීමට භාජනය වී තිබේ.**

*"V.S. ගැන රිමාන්ඩ් භාරයේ සිටිනා පුද්ගලයෙකු සමග කතා කල පොලිස් නිළධාරියා, 'අතන ඉන්න එකෙක්ව අරගෙන ඇවිල්ලා එලියට යනකන් විනෝදෙන් ඉන්නවා.' ඔහු මාව තල්ලු කලා නාන කාමරයට. මගේ ඇඳුම් ගලවන්න තැත් කලා. මම කෑ ගැහුවා මාව එලියට ගන්නය කියලා. ඊලඟට ඔවුන් මාව වෙන නාන කාමරයකට දැම්මා. එම නාන කාමරයට පසුපස හරවාගෙන එහි දොර ලග හිටපු පොලිස් නිළධාරියා මගේ කෑ ගැසීම් කිසිවක් කනකට ගත්තේ නෑ."*

**සිය මිතුරෙකුට සිදුවූ හදිසි අනතුරෙන් පසුව ඔහු සමග රෝහලට ගිය R.M. ද රෝහලේදී සරදමට සහ හාස්‍යයට භාජනය වී ඇත්තේ රෝහල් කාර්ය මණ්ඩලය අතින්.**

*"මගේ මිතුරිය සංක්‍රාන්තික සමාජභාවී කාන්තාවක්. ඇය සිදුවූ හදිසි අනතුරකට පසුව යාපනය රෝහළට ඇතුලත් කලා." මම ඇයව බැලීමට රෝහළට ගිය විට පිරිමි හෙදියක් මගෙන් විමසා සිටියේ "සහෝදරයා කොහෙද යන්නේ..?" යන්නයි. මම පැවසුවා "මගේ යහලුවා අනතුරකට ලක්ව රෝහල්ගත කර තිබෙන නිසා, මම ඇයව බැලීමට පැමිණියා." එවිට ඔහු පවසා සිටියේ "ඔයාට මෙතන ඉන්න බෑ. ඔයා වගේ අය හොරු වෙන්න පුලුවන්. අපරාධකාරයො වෙන්න පුලුවන්. ඒ නිසා ඔයාට මෙතන ඉන්න බෑ." යන්නයි.*

**S.G. සහ මිතුරාව පොලීසියට රැගෙන ගොස් තිබුණේ පොලිස් නිළධාරියෙකුට අනුව ඔවුන්ගේ "කට වැඩි වීම" හේතුවෙන්. මෙම දිවි ගලවා ගත් පුද්ගලයා ඔවුන්ගේ ලිංගික දිශානතිය/සමාජභාවී අනන්‍යතාවය ප්‍රකාශ කිරීමට ඇති අකමැත්ත නිසා HRCSL වෙත තම නඩුව ඉදිරිපත් කිරීමට පසුබට විය.**

*"ඊත් පොලිසියේ අය මට කතා කරලා මටයි මගේ යාළුවාටයි අපිව පොන්නයෝ කියලා අපහාස කළා. මුලින්ම අපට චෝදනා කළා ලිංගික වෘත්තියේ යෙදෙන්න වෙරළේ හිටියා කියලා, පස්සේ අපිව හොරු කියලා තවත් විවිධ අපහාස කරලා අපිව අත්අඩංගුවට ගත්තා."*

**H.G. සහ ඔහුගේ මිතුරාට සිවිල් ඇඳුමින් සැරසී සිටි පොලිස් නිලධාරීන් රොත්තක් විසින් බීමත්ව සිටින බවට සහ මත්ද්‍රව්‍ය පානය කර සිටින බවට බොරු චෝදනා එල්ල කොට, පහර දී, පොලිස් ස්ථානයට ගෙන ගොස්, රිමාන්ඩ් භාරයට පත් කළහ. ඒ ඔවුන් විසින්, ඉහත චෝදනා බොරු යැයි ඔප්පු කිරීමට අසල ඇති ආසිරි පෞද්ගලික වෛද්‍ය ශාලාව හරහා වෛද්‍ය පරීක්ෂණයක් කර බලන ලෙසට ඉල්ලීම් කරමින් සිටියදීය.**

*"අපි සිර මැදිරිය තුළ සිටියදී ඔවුන් අපට "පොන්නයා" වැනි අශිෂ්ට වචන වලින් කතා කලා. ඔවුන් අපි ගැහැනු ළමයින් මෙන් පෙනෙන බව පවසමින් අපේ පෙනුමට නිග්‍රහ කළා. ආසිරි රෝහළ හරහා වෛද්‍ය වාර්තාවක් ලබා ගැනීම ගැන මගේ මිතුරා කළ ප්‍රකාශය ගැන නිරන්තරවම කෝපයෙන් පසු වූ එක් නිලධාරියෙක් ඔහුට තර්ජනාත්මක ආකාරයෙන් නැවත නැවතත් පවසා සිටියේ "මම උඹට මෙඩිකල් පෙන්වන්නම්" යනුවෙන්.*

## හයවන කොටස:


# මූලික සොයාගැනීම්

01. වින්දිතයන් ලබාදුන් සාක්ෂි මත පදනම්ව: මානව හිමිකම් උල්ලංඝණය කිරීම්), ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු විවිධ සමාජ-ආර්ථික හේතූන් නිසා පැමිණිලි කිරීමට හෝ බලධාරීන් වෙත යාමට එතරම් කැමැත්තක් දක්වා නැත. එවැනි හේතූන් කිහිපයක් පහත දැක්වේ;

- ඔවුන්ගේ ලිංගික දිශානතිය/සමාජභාවය හේතුවෙන් සිදුවන වෙනස් කොට සැලකීමට ඇති බිය.
- චෝදනා එල්ල කිරීමේදී ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්/සේවයයන් තම සමාජභාවය සහ ලිංගික දිශානතිය ගැන දැනගනීය යන බිය.
- තම සමීපතමයන් විසින් සමච්චලයට ලක් වීම වැළැක්වීම සඳහා ඔවුන්ගේ කථා තමන් තුළම තබා ගැනීමට ඇති බලපෑම.
- තවදුරටත් පීඩාවට පත් වේ යැයි බිය.
- එය කිසිදු හිතකර යුක්ති සහගත ප්‍රතිඵලයක් නොලැබෙන විශාල කාර්ය පටිපාටික අපහසුතාවයකි.

02. සිදුවීම් වලින් බහුතරයක් මානව හිමිකම් කොමිසමට (HRCSL) ඉදිරිපත් කර ඇති අතර, ඉතිරි සිදුවීම් වල වින්දිතයන් එසේ HRCSL වෙත ඉදිරිපත් කිරීමට එකඟ වී නොමැත.

03. මානව හිමිකම් උල්ලංඝණය කිරීම් වල වින්දිතයන්ගෙන් 35% ක් පිටතට පැමිණ නැත.




04. මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමේ වඩාත් බහුල ආකාරය වන්නේ 12 වන ව්‍යවස්ථාව (100%) උල්ලංඝණය කිරීමයි, එයට හේතුව වනුයේ, උල්ලංඝණයන් සියල්ලම 12 වන ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම සහ අනෙකුත් උල්ලංඝනයන් සමඟ සම්බන්ධ වී ඇති බැවිනි. ඉන් පසුව 56% ක ප්‍රතිශතයක් සහිත 11 වැනි ව්‍යවස්ථාව, 6% ප්‍රතිශතයක් සහිත 13 වැනි ව්‍යවස්ථාව සහ 2.17% ප්‍රතිශතයක් සහිත 14 වැනි ව්‍යවස්ථාව සහ 0.50% ප්‍රතිශතයක් සහිත 14අ ව්‍යවස්ථාව වේ.

05. මානව හිමිකම් උල්ලංඝණයන්හි වින්දිතයන් බොහෝමයක් හඳුනාගෙන ඇත්තේ ගම්පහ දිස්ත්‍රික්කයෙනි, ප්‍රතිශතය 25.26%ක් වේ. (උතුරු නැගෙනහිර පළාත්වලින් ලැබෙන සීමිත සිදුවීම් ගණන නිසා මෙය නිශ්චිත ප්‍රතිඵලයක් නොවිය හැකිය.

06. මානව හිමිකම් උල්ලංඝණය කිරීම්වල වින්දිතයන් බොහෝමයක් වයස අවුරුදු 21-30 වයස් කාණ්ඩයට ඇතුළත් විය.

07. මානව හිමිකම් උල්ලංඝණය කිරීම්වල වින්දිතයන් බොහෝමයක් සංක්‍රාන්තික සමාජභාවී ස්ත්‍රීන් වේ. (37.02%)

08. මානව හිමිකම් උල්ලංඝණය කිරීම්වල වින්දිතයන් බොහෝමයකගේ ලිංගික දිශානතිය විෂමරිසි වේ. (25.53%) නමුත් ඔවුන් සියලු දෙනාම සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයන් වේ.

08. මානව හිමිකම් උල්ලංඝණය කිරීම්වල වින්දිතයන් බොහෝමයකගේ ලිංගික දිශානතිය විෂමරිසි වේ. (25.53%) නමුත් ඔවුන් සියලු දෙනාම සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයන් වේ.

09. මානව හිමිකම් උල්ලංඝණය කිරීම්වල වින්දිතයන් බොහෝමයක් සිංහල (72.34%) ලෙස හඳුනාගෙන ඇත (උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවලින් ලැබෙන සීමිත සිද්ධීන් සංඛ්‍යාව හේතුවෙන් මෙය නිශ්චිත ප්‍රතිඵලයක් නොවේ).

10. මානව හිමිකම් උල්ලංඝණය කිරීම්වල වින්දිතයන් බහුතරය උසස් පෙළ සුදුසුකම් ලත් පුද්ගලයන් වේ. (51.49%)

11. මානව හිමිකම් උල්ලංඝණය කිරීම්වල වින්දිතයන් බහුතරයක් රුපියල් 20000-40000 ආදායම් සීමාවට අයත් වන බැවින් ඔවුන් අවම වැටුපක් උපයති. (34.89%)

12. මානව හිමිකම් උල්ලංඝණය කිරීම්වල චූදිතයන් ලෙස පොලිසිය (40.85%), වෛද්‍ය අංශය (26.81%), ග්‍රාම නිලධාරීන්/නගර සභාවල නිලධාරීන් (9.36%), ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (3.83%), යුද හමුදාව (3.4%), රජයේ පාසල් සේවකයන් (2.13%), රෙජිස්ට්‍රාර් ජෙනරල් දෙපාර්තමේන්තුව (2.13%), දුම්රියපොළ සේවකයන් (1.28%), වෘත්තීය පුහුණු අධිකාරිය (0.85%), ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව (0.85%), ලංගම බස් සේවකයන් (0.85%), නීතිපති දෙපාර්තමේන්තුව (0.85%), ළමා හා කාන්තා කාර්යංශය (0.43%), සඳහන් කර නැත (0.43%), හමුදා පොලීසිය (0.43%), ග්‍රාම නිලධාරී (0.43%), ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව (0.43%), කම්කරු දෙපාර්තමේන්තුව (0.43%), පළාත් සභාව (0.43%), නගර සභාව (0.43%), නාවික හමුදාව (0.43%), හඳුනාගෙන ඇත.

## හත්වන කොටස:
# නිගමනය

දත්ත විශ්ලේෂණයෙහි පරමාර්ථය වූයේ 2021 අගෝස්තු සිට 2023 මාර්තු දක්වා එකතු කරන ලද සිද්ධීන් 235ක් මත පදනම්ව ශ්‍රී ලංකාවේ LGBTQ ප්‍රජාව මුහුණ දුන් උල්ලංඝණයයන් ගණනය කිරීමයි.

විශ්ලේෂණවලින් පෙනී යන්නේ පවතින දණ්ඩ නීති සහ සමාජයේ දිගින් දිගටම පවතින විවිධ සමාජ අපහාසයන් හේතුවෙන් බොහෝ LGBTQ පුද්ගලයන් බලධාරීන් වෙත යාමට (උදා: ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හෝ පොලිසිය) මැලි වන බවයි. මෙයට LGBTQ පුද්ගලයන් මනෝවිද්‍යාත්මකව අසාධ්‍ය බව පවසන හෝ එය ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා ගැටෙන 'ප්‍රවණතාවක්' හෝ 'ජීවන රටාවක්' ය යන සාවද්‍ය මත ඇතුළත් විය හැකිය.

## අටවන කොටස:
# නිර්දේශ

වින්දිතයන් ලබාදුන් සාක්ෂි මත පදනම්ව: මානව හිමිකම් උල්ලංඝණය කිරීම්), ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු විවිධ සමාජ-ආර්ථික හේතූන් නිසා පැමිණිලි කිරීමට හෝ බලධාරීන් වෙත යාමට එතරම් කැමැත්තක් දක්වා නැත. එවැනි හේතූන් කිහිපයක් පහත දැක්වේ;

## සාමාන්‍ය නිර්දේශ

1. **නීති ප්‍රතිසංස්කරණය :**

සමරිසි සබඳතා ශ්‍රී ලංකාව තුළ අපරාධයක් ලෙස සලකනු ලබන බැවින් නීතිය ක්‍රියාත්මක කරන්නන් සහ රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ට නොනවත්වා සිදුකරන වෙනස්කොට සැලකීම් සහ හිරිහැරයන් සාධාරණීකරණය කරනු ලැබේ. සමාජභාවය හඳුනාගැනීමේ සහතිකය හඳුන්වාදීමත් සමඟ සමාජභාවය හඳුනාගැනීමේ ප්‍රගතියක් ඇති බව පෙනුනද, (කෙසේ වෙතත් බොහෝ රාජ්‍ය නිලධාරීන් මේ පිළිබඳව දැනුවත්ව නැත), LGBTQ ප්‍රජාවේ පුද්ගලයන් සාපරාධී කරනු ලබන දැඩි නීති නිසා ඔවුන්ට සමානව සැලකීමට සහ පිළිගැනීමට ඉල්ලීම් කරමින් සදා අරගල කිරීමට සිදුවනු ඇත. එබැවින්, 1833 ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ 365 වගන්තිය සහ 365අ වගන්තිය ඇතුළු මෙම දැඩි නීති සම්පූර්ණයෙන් අවලංගු කිරීමෙන් පමණක් ප්‍රජාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සහතික කරනු ඇති අතර රාජ්‍ය බලධාරීන් ඔවුන්ගේ බලය අනිසි ලෙස භාවිතා නොකරන බව සහ ප්‍රජාවගේ අයිතීන්ට එරෙහිව සිදුවන වෙනස් කොට සැලකීම සිදු නොවන බව සහතික කරනු ඇත. මේ වන විට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව තුළ LGBTQ පුද්ගලයන් නිර්සාපරාධීකරණය කිරීමේ පනත් කෙටුම්පතක් සාකච්ඡාවට ලක්ව ඇති ඇත. එහි ධනාත්මක ප්‍රතිඵලයක් සිදු වුවහොත් ශ්‍රී ලංකාවේ LGBTQ පුද්ගලයන්ගේ සුබසාධනය සඳහා රුකුලක් වනු ඇත.

2. **නඩු පැවරීමට වින්දිතයන් දිරිමත් කිරීම :**

වෙනස් කොට සලකන ක්‍රියාවන්ට අභියෝග කිරීම යනු නීති ප්‍රතිසංස්කරණවල වැදගත් කොටසකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම් වලට අනුව වෙනස් කොට සැලකීමේ ක්‍රියාවන් ශ්‍රේෂ්ඨාධිකරණයේදී අභියෝගයට ලක් කළ හැකිය. අභියාචනාධිකරණයේ රිට් අධිකරණ බලය භාවිතා කරමින්ද මෙම ක්‍රියාවන් අභියෝගයට ලක් කළ හැකිය. උදාහරණයක් වශයෙන්, EQUAL GROUND සහ Centre for Policy Alternatives හි විධායක අධ්‍යක්ෂ ඇතුළු තවත් හත් දෙනෙක් එකතුව ශ්‍රී ලංකාවේ අභියාචනාධිකරණයට පෙත්සමක් ගොනු කර, ද්වේෂ සහගත, වැරදි සහගත ලෙස සහ LGBTQ ප්‍රජාව සම්බන්ධයෙන් වෙනස් කොට සැලකීමේ ප්‍රකාශයන් සිදු කරන ලද පොලිසිය සඳහා වූ පුහුණු වැඩසටහනක් පැවැත්වීම සම්බන්ධයෙන් තහනම් නියෝගයක් ඉල්ලා සිටියහ.

එබැවින් වින්දිතයන්ගේ දුක්ගැනවිලි උසාවියට ඉදිරිපත් කිරීමට ඔවුන් උනන්දු කළ යුතුය. කෙසේ වෙතත්, මේ සඳහා පුද්ගලයන්ට රටේ නීති පද්ධතිය කෙරෙහි විශ්වාසයක් තිබීම අවශ්‍ය වන අතර මෙම අඩුව නිසා වින්දිතයන් තමන් මුහුණ දෙන වෙනස්කම් ගැන ප්‍රකාශ කිරීම ප්‍රතික්ෂේප කිරීමට හේතු වී ඇත.

3. **LGBTIQ පුද්ගලයගේ අයිතිවාසිකම් පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම :**

ශ්‍රී ලංකාවේ LGBTQ පුද්ගලයන් ඔවුන්ගේ සමාජභාවය හෝ ලිංගික දිශානතිය හේතු කොටගෙන වෙනස් කොට සලකන විට ඔවුන්ට විශ්වාසය තැබිය හැකි විවිධ නීති සහ ව්‍යවස්ථාපිත විධිවිධාන පිළිබඳව දැනුවත් කළ යුතුය. දත්තයන්හි සඳහන් නිගමන මඟින් බස්නාහිර පළාතෙන් පිට පළාත්වලින් අපරාධ හෝ උල්ලංඝණය කිරීම් සැලකිය යුතු ප්‍රමාණයක් නොපෙන්වන නමුත්, යම්කිසි උල්ලංඝණය වීමකදී

දිවයින පුරා සිටින පුද්ගලයින්ට ඔවුන්ගේ අයිතිවාසිකම් සහ ඔවුන්ට කළ හැකි දේ පිළිබඳව දැනුවත් කිරීමට යාන්ත්‍රණයක් සැකසීම වැදගත් වේ. කොළඹ සිටින LGBTIQ පුද්ගලයින්ට උපකාරක සේවා සඳහා පහසු ප්‍රවේශයක් තිබිය හැකි අතර, දිවයිනේ අනෙකුත් ප්‍රදේශවල සිටින ප්‍රජාවේ සාමාජිකයින්ට එම සේවාවන් වෙත ප්‍රවේශ වීමේ දුෂ්කරතා ඇති වේ. එබැවින්, මෙම දැනුවත් කිරීමේ/අධ්‍යාපනික වැඩසටහන් දෙමළ සහ සිංහල භාෂාවෙන් ආන්තිකරණයට ලක්වූවන් බහුතරයක් වෙසෙන රටේ අනෙකුත් ප්‍රදේශවලද පැවැත්විය යුතුය. නිවැරදි නීතිමය තොරතුරු ප්‍රජාවේ සාමාජිකයින්ට ලබා දිය යුතුය. එය වෛද්‍ය සායන, දැනුවත් කිරීමේ වැඩසටහන් ආදියේදී ඔවුන්ට ලියවිල්ලක ස්වරූපයෙන් ලබාදිය හැකිය. මෙම ලේඛනයේ ශ්‍රී ලංකාවේ LGBTQ පුද්ගලයන්ට අදාළ සියලුම නීති සහ ප්‍රතිපත්ති භාෂා තුනෙන්ම සරලව අඩංගු කළ හැක.

## විශේෂ නිර්දේශ

### නීති ප්‍රතිසංස්කරණය

**4. අධ්‍යාපන ආයතන (පාසල් සහ උසස් අධ්‍යාපන ආයතන) තුළ ප්‍රතිසංස්කරණ :**

මානව හිමිකම් උල්ලංඝණයන්හි වූදිතයන්ගෙන් 2.13% ක් රජයේ සහ පෞද්ගලික අධ්‍යාපන ආයතනවල ගුරුවරුන් සහ කථිකාචාර්යවරුන් වේ. අධ්‍යාපන ආයතන තුළ සිදුවන වෙනස්කොට සැලකීම සහ හිරිහැර කිරීම් ද මෙයට ඇතුළත් වේ. LGBTQ ප්‍රජාවේ සිසුන් සුරක්ෂිත කිරීම සඳහා හිරිහැර විරෝධී ප්‍රතිපත්ති (Anti-Bullying Policies) අධ්‍යාපන ආයතන තුළ ශක්තිමත් ලෙස සකස් කළ යුතුය. තවද, ඔවුන් සමාජභාවී අනන්‍යතාවය, ලිංගික අධ්‍යාපනය, ලිංගික සහ ප්‍රජනක සෞඛ්‍ය අයිතිවාසිකම් සහ ලිංගික දිශානතිය සම්බන්ධ ගැටළු පිළිබඳව සිසුන් සහ ගුරුවරුන් සමඟ සංවේදී වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. මෙය ඔවුන්ගේ ලිංගභේදය හෝ සමාජභාවී අනන්‍යතාවය සමඟ පොරබදමින් සිටින දරුවන්ට ඔවුන්ගේ ගැටළු පිළිබඳව කතා කිරීමට සහ අවශ්‍ය මග පෙන්වීම ලබා ගැනීමට ආරක්ෂිත අවකාශයක් ගොඩනැගීමට උපකාරී වේ. මෙම සංවේදී මාතෘකා පිළිබඳව වඩාත් සංවේදීව සහ අවබෝධයෙන් කටයුතු කිරීමට සහ තත්ත්වය වඩා හොඳින් හැසිරවීමට එය ගුරුවරුන්ට තවදුරටත් හැකියාව ලබා දෙනු ඇත.

**5. LGBTQ ප්‍රජාවගේ ගැටළු පිළිබඳව සංවේදී කිරීම සඳහා ඔවුන්ගේ අත්දැකීම් සහ දුෂ්කරතා මහජන සහ රාජ්‍ය නිලධාරීන් (රජයේ වෛද්‍ය නිලධාරීන් ඇතුළුව) සමඟ බෙදා ගැනීම :**

වින්දිතයන් විසින් බෙදාගත් අත්දැකීම් මත පදනම්ව, සමහර අවස්ථාවලදී මෙම කඩකිරීම් සිදුකරන මහජනතාව සහ රජයේ නිලධාරීන් අතර සහකම්පනය නොමැති බව පැහැදිලිව පෙනේ. එසේම සමාජභාවී අනන්‍යතාවය සහ ලිංගික දිශානතිය පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම අත්‍යවශ්‍ය වේ. මන්ද, නිලධාරියකුට තම මිතුරන් කෙරෙහි සහකම්පනයක් නොමැති නම් ඔහු සිය අභිමතය පරිදි ක්‍රියා කරයි. එබැවින් රාජ්‍ය නිලධාරීන් සහ නීතිය ක්‍රියාත්මක කරන්නන් සඳහා නිර්මාණය කරන අධ්‍යාපන වැඩසටහන්වලදී අවිහිංසාව සහ නිවැරදි හැසිරීම වැනි මානව අගයන් පිළිබඳ අධ්‍යාපනය ද ඇතුළත් විය යුතුය.

## HRCSL වෙත නිර්දේශ

6. **LGBTQ ප්‍රජාවට අදාළව ප්‍රධාන උල්ලංඝණය කිරීම්, ප්‍රධාන චූදිතයන් සහ වින්දිතයන්ගේ ස්වභාවය පිළිබඳ සටහනක් පවත්වා ගැනීම:**

HRCSL වෙත ඉදිරිපත් කරන ලද සිද්ධි වල අන්තර්ගත උල්ලංඝණය කිරීම්, ප්‍රධාන චූදිතයන් සහ වින්දිතයන්ගේ ස්වභාවය පිළිබඳ සංඛ්‍යානමය වාර්තාව මඟින් සිවිල් සමාජ සංවිධානවලට බිම් මට්ටමට ළඟා වීමට සහ LGBTQ පුද්ගලයින් අතර කැපී පෙනෙන ගැටළු විසඳීමට සහාය වනු ඇත. මෙමඟින් ශ්‍රී ලංකාවේ ප්‍රජාවගේ සමාජ-ආර්ථික තත්ත්වය පිළිබඳ පුළුල් අදහසක් ලබා ගැනීමට දේශීය මෙන්ම ජාත්‍යන්තර සිවිල් සමාජවලට ද උපකාර වනු ඇත. එබැවින් මෙය අනාගතයේදී ප්‍රජා මූලික ක්‍රියාකාරකම් ප්‍රතිසංස්කරණය කිරීමේ සහ සංවර්ධනය කිරීමේ මෙවලමක් බවට පත්වනු ඇත.

## පොලිසියට සහ හමුදාවට නිර්දේශ

7. **පොලිස් නිලධාරීන් සහ ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයින් සඳහා වන පුහුණු සැසිවලට ලිංගිකත්වය සහ සමාජභාවය පිළිබඳ පුහුණුව ඇතුළත් කිරීම:**

මානව අයිතිවාසිකම් උල්ලංඝනය කරන්නන් අතුරින් 40.85% ක් පොලිසිය වන අතර 3.40% ක් යුධ හමුදාව සහ 0.43% නාවික හමුදාව වේ. මේ අනුව, හුදෙක් නීති සහ ප්‍රතිපත්ති පැවතීම ප්‍රමාණවත් නොවන අතර වැදගත් වන්නේ ඒවා ක්‍රියාවට නැංවීමයි. මෙය ක්‍රියාවට නැංවීම සඳහා නීති ක්‍රියාත්මක කරන බලධාරීන්ව, මෙම නීති සහ ප්‍රතිපත්ති තීරණ, සමාජභාවය සහ සමාජභාවී අනන්‍යතාවයේ සංකීර්ණතා පිළිබඳව දැනුවත් කළ යුතුය. බොහෝ වින්දිතයන් සමාජභාවය හඳුනාගැනීමේ සහතිකය පිළිබඳව පොලිස් නිලධාරීන් සතුව දැනුමක් නොමැති බව අනාවරණය කරමින් මෙම ක්‍රමය තුළ පවතින දෝෂ පිළිබඳව පෙන්වා දුන්හ. අලුත්කඩේ පොලිස් ස්ථානයේ පොලිස් නිලධාරියෙකු සමඟ LGBTQ ප්‍රජාවට සලකන ආකාරය පිළිබඳව සිදු කළ සම්මුඛ සාකච්ඡාවක දී අනාවරණය වූයේ දෙපාර්තමේන්තු මට්ටමින් පොලිස් නිලධාරීන් සඳහා අනිවාර්යයෙන්ම පැවැත්වෙන පුහුණු සැසිවලදී ඔවුන් හට ලිංගිකත්වය සහ සමාජභාවය පිළිබඳ කිසිදු දැනුවත්භාවයක් ලබා දීමක් සිදු නොකරන බවයි. සියලුම පුරවැසියන්ට සමානව සැලකීමට නීතිය ක්‍රියාත්මක කිරීමට වගකිව යුතු රාජ්‍ය නිලධාරීන්ට LGBTQ පුද්ගලයන් සහ ඔවුන් අප සමාජය තුළ මුහුණ දෙන වෙනස් කොට සැලකීම් සහ අභියෝග පිළිබඳව නිසි අධ්‍යාපනයක් ලබා දිය යුතුය.

8. **LGBTQ පුද්ගලයින්ගේ අත්දැකීම් සහ දුෂ්කරතා පොලිස් නිලධාරීන් සහ හමුදා සාමාජිකයින් සමඟ බෙදා හදා ගනිමින් ඔවුන්ගේ ගැටලු සම්බන්ධයෙන් සංවේදනයක් ඇති කිරීම:**

පොලීස් සහ හමුදා නිලධාරීන් විශේෂයෙන් ම යුධ හමුදා නිලධාරීන් සහ නාවික හමුදා නිලධාරීන් තුළ LGBTQ ප්‍රජාව පිළිබඳව පවතින අගතිගාමී ආකල්ප නිසා, LGBTQ ප්‍රජාව පිළිබඳ සහකම්පනයක් නොමැති අතර ඒ හේතුවෙන් ප්‍රජාවට එරෙහිව අපරාධ සහ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සිදු කරන බව, වින්දිතයන් විසින් බෙදාහදා ගත් අත්දැකීම් මඟින් පැහැදිලිව පෙනී යයි. සමාජභාවී අනන්‍යතාවය සහ ලිංගික දිශානතිය පිළිබඳව ඔවුන්ව දැනුවත් කිරීම අත්‍යවශ්‍ය වන අතරම, නිලධාරියෙකු තුළ තමන් හා සමාන පුද්ගලයින් කෙරෙහි සංවේදනයක් නොවේ නම් ඔහු ක්‍රියා කරන්නේ ඔහුගේ කැමැත්ත මත බව වටහා ගැනීමද ඒ හා සමානව වැදගත් වේ. එබැවින් පොලිස් නිලධාරීන් සහ හමුදාව සඳහා නිර්මාණය කර ඇති අධ්‍යාපන වැඩසටහන් තුළ අවිහිංසාව සහ නිවැරදි හැසිරීම වැනි මානව වටිනාකම් පිළිබඳ අධ්‍යාපනය ඇතුළත් විය යුතුය.

## සිවිල් සමාජ සංවිධාන සඳහා නිර්දේශ

### 9. LGBTQ සඳහා වන උපකාරක සේවාවන් පිළිබඳ සමාජ මාධ්‍ය තුළින් දැනුවත් කිරීම:-

Equal Ground වැනි විවිධ සිවිල් සමාජ සංවිධාන විසින් LGBTQ පුද්ගලයන්ට අවශ්‍ය අවස්ථාවන්හිදී උපකාර කිරීම සඳහා උපකාරක සේවා පිහිටුවා ඇති අතර මෙම උපකාරක සේවා පිළිබඳ තොරතුරු දිවයිනේ සෑම ප්‍රදේශයකම සිටින අයට ප්‍රචාරය කළ යුතුය. මෙය ක්‍රියාත්මක කිරීමට හොඳම ක්‍රමය වනුයේ Facebook, Tiktok සහ Instagram වැනි LGBTQ පුද්ගලයින් ඇතුළු තරුණ පරම්පරාවන් බහුලව භාවිතා කරන සමාජ මාධ්‍ය වේදිකා භාවිතා කිරීමයි.

### 10. LGBTQ සඳහා වන උපකාරක යෙදුමක් (App) සෑදීම:-

මෙය සිවිල් සමාජයන් වෙත යොමු කරන ලද යෝජනාවකි. අවශ්‍ය අවස්ථාවල දී උපකාර ලබා ගැනීමට සහ මඟ පෙන්වීම් ලබා ගැනීමට පුද්ගලයන්ට පහසුවෙන් ළඟා විය හැකි උපකාරක සේවාවක් තිබීම වැදගත් වේ. නීති ආධාර සපයන සිවිල් සමාජ සංවිධාන, සමාජ මාධ්‍ය හරහා ජනප්‍රිය කළ හැක. අවශ්‍ය පුද්ගලයින් සඳහා නීතිමය, ආර්ථික සහ මනෝවිද්‍යාත්මක සහාය සඳහා සම්බන්ධතා තොරතුරු අඩංගු වන පරිදි යෙදුම සංවර්ධනය කළ හැකි අතර වින්දිතයන්ට ගැටලුව ඇතුළු කිරීමෙන් පසුව ක්ෂණිකව මාර්ගෝපදේශ ලබා ගැනීමට හැකි වේ. එවැනි පහසුවෙන් ළඟා විය හැකි උපකාරක යාන්ත්‍රණයක් තිබීම මඟින් අයිතිවාසිකම් උල්ලංඝනය හෝ වෙනස් කොට සැලකීම සිදු වූ ස්ථානය කුමක් වුවත්, ඕනෑම අයෙකුට ඒ සඳහා කඩිනම් මාර්ගෝපදේශනයක් ලබා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

### 11. LGBTQ පුද්ගලයන්ගේ දෙමාපියන්, පවුල සහ මිතුරන් අතර උපකාරක ජාලයක් නිර්මාණය කිරීම:-

මූලික සොයාගැනීම්වලින් පෙනී යන්නේ වින්දිතයන්ගෙන් බොහෝමයක් තම පවුලට සිදුවන අපහාසවලට ඇති බිය නිසා ඔවුන්ට එරෙහිව සිදු වන අපරාධ සහ උල්ලංඝණයන් පිළිබඳව බලධාරීන් වෙත යෑම ප්‍රතික්ෂේප කරන බවයි. මෙම පුද්ගලයින්ට යුක්තිය ඉටු කර ගැනීම සඳහා මොවුන්ට සමාජයෙන් සිදු වන විවිධ නින්දා අපහාසයන් පද්ධතිමය වෙනසක් හරහා අවම කල යුතුය. මෙය එක රැයකින් ක්‍රියාත්මක කළ හැකි ක්‍රියාවලියක් නොවන නමුත්, LGBTQ පුද්ගලයන් සිටින පවුල්වල අයට තේරුම් කිරීමට සහ සංවේදී වීමට උපකාර කිරීමට හැකිය. LGBTQ පුද්ගලයින් සහිත පවුල්වල සාමාජිකයින්ට, දැනටමත් චිත්තවේගීය හා සමාජීය ගැටළු වලට මුහුණ දුන් LGBTQ පුද්ගලයින් සහිත පවුල්වල සාමාජිකයින් වෙත ළඟා විය හැකි ජාලයක් නිර්මාණය කර ඔවුන් අතර සහයෝගීතාවයක් ඇති කිරීමට යෝජනා කළ හැකිය. මෙමඟින් අනෙකුත් අයගේ අත්දැකීම්, ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් අත්විඳින සිදුවීම් තේරුම් ගැනීමට සහ සානුකම්පිත ප්‍රවේශයක් ගැනීමට උපකාර වනු ඇත.

## පෞද්ගලික අංශයට නිර්දේශ

### 12. ශ්‍රම බලකාය දැනුවත් කිරීම:

LGBTQ පුද්ගලයින් බහුතරයක් තමාගේ සේවා ස්ථානවලදී වෙනස් කොට සැලකීමට සහ අපරාධවලට ගොදුරු වී ඇති බව වින්දිතයන් දෙනු ලබන සාක්ෂි වලින් පෙන්නුම් කෙරේ. තවද, සමහර වින්දිතයන් ඔවුන්ගේ සමාජභාවය හෝ ලිංගික දිශානතිය හේතුවෙන් රැකියා අවස්ථාද මඟහැරී ඇත. මෙනිසා, පෞද්ගලික සහ රාජ්‍ය යන දෙඅංශයටම උපාය මාර්ගිකව සැලසුම් කළ, සංවේදීතාවය ඇතිකිරීමේ වැඩසටහන් අත්‍යවශ්‍ය වේ. මෙම වැඩසටහන්වලට සමාජභාවය සහ ලිංගිකත්වය පිළිබඳ ගැටළු සහ ඒවා සමඟ එන අභියෝග පිළිබඳව විවෘත සාකච්ඡාවක් ද ඇතුළත් කල හැකිය. මෙමඟින් LGBTQ පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහතික කෙරෙන අතර රාජ්‍ය/පෞද්ගලික ආයතන තුළදී සහ ඉන් පිටතදී රැකියා අවස්ථා සඳහා වඩා හොඳ ප්‍රවේශයක් ලබා ගැනීමට ඔවුන්ට හැකි වේ.

## වින්දිතයන් සඳහා නිර්දේශ

### 13. වින්දිතයන්ට එරෙහිව සිදු වූ මානව හිමිකම් උල්ලංඝණය කිරීම් සහ සාමාන්‍ය අපරාධයන් සම්බන්ධයෙන් බලධාරීන් වෙත ප්‍රවේශ වීම සහ LGBTQ ප්‍රජාවේ අනෙකුත් පුද්ගලයින්වද එසේ කිරීමට දිරිමත් කිරීම:

වින්දිතයන්ට සිදු වූ වෙනස්කම්වලට එරෙහිව සහාය වීමට යම් යම් නීතිමය යාන්ත්‍රණයන් පවතින අතර, ඔවුන්ගේ යහපත සඳහා මෙම නීතිමය සහන වෙත ප්‍රවේශ වීම වැදගත් වේ. ප්‍රතිපත්තිමය වෙනස්කම් සහ නීතිමය ප්‍රතිසංස්කරණ දියුණු කිරීම සඳහා එවැනි සිදුවීම් පිළිබඳ වාර්තාවක් තිබීම වැදගත් වේ. මෙනිසා, සෑම වින්දිතයකුගේම කතාව ඔවුන්ගේ ප්‍රජාවේ අනෙකුත් සාමාජිකයින්ට සිදුවන අයුක්තිය වළක්වා ගැනීමට උපකාරී වන බව ඔවුන් හඳුනාගත යුතුය.

### 14. පොලිසිය, රාජ්‍ය නිලධාරීන් සහ අනෙකුත් අපරාධකරුවන් විසින් සිදුකරන ක්‍රියාවන් පුරවැසියන් වශයෙන් වින්දිතයන්ගේ පරමාධිපත්‍යය උල්ලංඝණය කිරීමක් වන බව සහ එනිසා වින්දිතයන්ට ඔවුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අයිතියක් ඇති බව ඔවුන්ට දැන්වීම:

වින්දිතයන් ඔවුන්ට හිමිව ඇති මානව හිමිකම් පිළිබඳව දැනුවත් බව සහ ඔවුන්ගේ සමාජභාවී අනන්‍යතාවය හෝ ලිංගික දිශානතිය මත පදනම්ව ඔවුන්ට සිදු වන වෙනස් කොට සැලකීම් තවදුරටත් ඉවසා ගෙන නොසිටින බව රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම වැදගත් වේ. මෙමඟින් ප්‍රජාවේ අනෙකුත් සාමාජිකයින්ට එරෙහිව එම වරදම හෝ උල්ලංඝණය කිරීම ම සිදු කරන විට දෙවරක් සිතන ලෙස චූදිතයන්ව පොළොඹවනු ලබයි.

BRIDGE to Equality යනු ශ්‍රී ලංකාවේ LGBTQ ප්‍රජාවන්ගේ මානව හිමිකම් සුරැකීම වෙනුවෙන් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි. ජාත්‍යන්තර මානව හිමිකම් සහ නීති පිලිබඳව විනිසුරුවරුන්, නීතීඥයින් සහ අනෙකුත් මානව හිමිකම් ක්‍රියාකාරීන් දැනුවත් කිරීම තුළින් ශ්‍රී ලංකාවේ LGBTQ පුද්ගලයින්ගේ මානව හිමිකම් සුරක්ශිත කිරීම, ශ්‍රී ලංකාවේ වත්මන් නීතිමය රාමුව විසින් පනවන ලද අභියෝග ජය ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම, මානව හිමිකම් කඩ වූ ශ්‍රී ලංකාවේ LGBTQ පුද්ගලයින් හට යුක්තිය ලබා ගැනීමට ඔවුනට අවශ්‍ය සහය ලබාදීමද අරමුණු කරගනී.

BRIDGE to Equality ව්‍යාපෘතිය 2021 වසරේ සිට DAST, National Transgender Network සහ Young Out Here ආයතන විසින් ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිෂන් සභාව සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබයි.


www.bridge2equality.org

bridgetoequality@gmail.com

facebook.com/BridgetoEquality

instagram.com/bridge.to.equality

twitter.com/bridge_equality

youtube.com/@bridgetoequality